**රුහුණ විශ්වවිද්‍යාලය - 2020**

---

## 1.1 මූල්‍ය ප්‍රකාශන

රුහුණ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

රුහුණ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා රුහුණ විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලටට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ  පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය  ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම    ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

**අත්තිකාරම්**

------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 හා 2019 වර්ෂවල ආචාර්යවරුන් 26 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.3,149,340ක් වූ පර්යේෂණ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් වහාම පියවීමට උපදෙස් ලබාදී ප්‍රමාද වීම් සම්බන්ධයෙන් විමසා ලිපි යොමු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් මුදල් පියවීමට ක්‍රියාකළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45(2)හි (xv) වන උප වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව පශ්චාත් උපාධි පීඨයේ රු.79,755,690 ක අතිරික්ත මුදලක් ස්ථාවර තැන්පතු 03ක ආයෝජනය කර තිබුණි. | සියළු ආයෝජන කර ඇත්තේ පාලක සභා අනුමැතියෙන් විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ ගිණුම් පවත්වාගෙන යන මහජන බැංකුවේය. | අදාළ අනුමැතිය ලබා ගෙන මුදල් ආයෝජනය සිදු කල යුතුය. |
| (ආ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 94/30 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනු දැනුම හා එහගත්වය ලබා ගතයුතු වුවද එසේ ලබානොගෙන ව්‍යාපෘති 05 ක් ආරම්භ කර තිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කරන ජාත්‍යයන්තර ඒකකය විසින් අදාළ අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | විදේශ ව්‍යාපෘති ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | | | |
| (I) | 4(I) ඡේදය | 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර පර්යේෂණ යෝජනා අනුමත කරවා නොගෙන විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | උසස් අධ්‍යාපන චක්‍රෙල්ඛ අංක 1/2011 සහ 1/2011(1) අදාළ කර ගත යුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 5/2014(1) මඟින් උපදෙස් දී ඇති බැවින් ඒ අනුව අදාල පර්යේෂන දීමනා ගෙවා ඇත. | කළමනාකරණ සේවා චක්‍රෙල්ඛය මඟින් 2011 අය වැය චක්‍ර ලේඛනය අවලංගු කර ඇති බැවින් මෙම කළමනාකරණ සේවා චක්‍රලේඛනය පදනම් කරගෙන පර්යේෂන දීමනා ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (II) | 4(II) ඡේදය අනුව | පර්යේෂණ ආරම්භ කර මාස 06 ක් ඇතුළත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිරිපත් කරන පර්යේෂණ වාර්තාවන් සඳහා කමිටු අනුමැතිය ලබාගෙන විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට පර්යේෂණ දීමනා ගෙවිය යුතු වුවත් ඒ අනුව ගෙවීම් සිදුකර නොතිබුණි. | උසස් අධ්‍යාපන චක්‍රෙල්ඛ අංක 1/2011 සහ 1/2011(1) අදාළ කර ගත යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 5/2014(1) මඟින් උපදෙස් දී ඇති බැවින් ඒ අනුව ගෙවීම් සිදුකර ඇත. | කළමනාකරණ සේවා චක්‍රෙල්ඛය මඟින් 2011 අය වැය චක්‍ර ලේඛනය අවලංගු කර තිබේ. එමෙන්ම 2/2014 ද කළමනාකරණ චක්‍රලේඛනය පදනම් කරගෙන පර්යේෂන දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (III) | 4(III) ඡේදය | ආචාර්යවරුන්ගේ පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශනයක පළ කිරීමට කටයුතු කළද, චක්‍රලේඛයේ 5 (ii) ඡේදයෙහි සඳහන් පර්යේෂණ අධීක්ෂණ කමිටුව වෙත අවසාන පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | උසස් අධ්‍යාපන චක්‍රලේඛ අංක 1/2011 සහ 1/2011(1) අදාළ කර ගත යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 5/2014(1) මඟින් උපදෙස් දී ඇත. ඒ අනුව අදාල පර්යේෂන දීමනා ගෙවා ඇත. | 2011 අය වැය චක්‍රලේඛනය පදනම් කරගෙන නිකුත් කරන ලද 1/2011 චක්‍රලේඛනය අවලංගු වේ. ඒ අනුව 2/2014 චක්‍රලේඛනය පදනම් කරගෙන පර්යේෂන දීමනා ගෙවීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 30 දිනැති අංක 2016/3 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානී හැර අනෙක් සියළුම දේශකවරු චක්‍රලේඛනය උපදෙස් අනුව සතියක් තුළ ඉටුකල යුතු අවම දේශන පැය ප්‍රමාණයට වඩා සියයට 70ත් 50ත් අතර ප්‍රමාණයක් අඩුවෙන් දේශන පවත්වා තිබුනි. | කථිකාචාර්ය තනතුරේ පරිවාස කාලය තුළ සේවය කරන කථිකාචාර්යවරු දෙදෙනෙකුගේ සේවා ස්ථිර කිරීමේ කොන්දේසියේ වූ පශ්චාත් උපාධි පාඨමාලා කටයුතුවලට සහනයක් සඳහා අඩු ඉගැන්වීම් කාලයක් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දේශකවරුන්ගෙන් සියයට 83 ක් සඳහා එකවර අධ්‍යයන නිවාඩු ලබා දිය නොහැකිය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 294 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 834 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 1,128, ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු.මිලියන 272 කින් වැඩියෙන් ලැබීම හා මෙහෙයුම් වියදම් රු.මිලියන 285 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආසියා පැසිෆික් නෙට්වර්ක් (APN)ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර සහකාර හා විද්‍යාගාර සහකාර සේවක තනතුර තනතුරු 02ක් ලෙස සලකා සේවකයෙකුට රු.389,349ක් වැඩිපුර වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අදාළ සේවකයා විද්‍යාගාර කටයුතු සඳහා මනාව පුහුණු කර තිබූ බැවින් ක්ෂේත්‍රයේ සාම්පල එකතු නොකරන දින වලදී ඔහුගේ සේවය ලබාගෙන පෙර අනුමත කරන ලද ප්‍රමාණය නොඉක්මවන ලෙස ගෙවීම් කර ඇති බව දන්වමි. | මෙම නිලධාරියා ක්ෂේත්‍රයේ සේවය නොකරන දිනවලදී විද්‍යාගාරයේ සේවය කර තිබේ . එබැවින් තනතුරු දෙකක් ලෙස සලකා ගෙවීම්කළ නොහැක. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂිකව පර්යේෂණ දීමනා ලෙස රු. මිලියන 236 ක් ගෙවා තිබුණද සිදු කර තිබූ පර්යේෂණ හා ඒවායේ ප්‍රතිඵල ජනතාව වෙත සන්නිවේදනය වී නොතිබුණි. | පරීක්ෂණ ප්‍රතිඵල පත්‍රිකා ප්‍රකාශ කිරීම නිරන්තරයෙන් සිදුවේ. එම පර්යේෂණ ප්‍රතිඵල මත අදාළ සිසුන් හෝ ආචාර්යවරුන් තවදුරටත් එම කටයුතු කරගෙන යනු ලැබේ. | පර්යේෂණයක ප්‍රතිඵල ප්‍රකාශනයක එල කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ඒවාගේ ප්‍රතිඵල ජනතාව වෙත සන්නිවේදනය කිරීමට වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | තාක්ෂණ පීඨයේ පරීක්ෂාවට භාජනය කළ ප්‍රතිඵල සටහන් අනුව 2018 හා 2019 වර්ෂවලට අදාළ 1 හා 2 අදියරවල සමාසික දෙකෙහි පැවැත්වූ විභාගවලින් අසමත්වීමේ ප්‍රතිශතය සියයට 30 ක සිට සියයට 98 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මීට අදාල ගැටලු දැනටමත් හඳුනාගෙන ඇති අතර මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමට අවධානය යොමු කර ඇත . | සිසුන් විභාග අසමත් වීමට බලපාන හේතුන් සොයා ගැටළු විසදීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | තාක්ෂණ පීඨයේ 2019 වර්ෂයේ පැවති අදියර 1 හි දෙවන සමාසිකයෙහි විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 72 ක් විභාගය අසමත් වී තිබුණ අතර සමත් සිසුන්ගෙන් සියයට 63 ක් විභාගය සමත්වීමේ පහළ සාමාර්ථය වූ සී සාමාර්ථය ලබාගෙන තිබුණි. | තාක්ෂණ පීඨයේ සිසුන්ගේ විෂය කරුණු සම්බන්ධයෙන් දැනුම හා අවබෝධ කර ගැනීමේ හැකියාව දුර්වල වීම සහ සමහර ආචාරයවරුන්ද සිසුන්ගේ දැනුම පිළිබඳ අවබෝධයෙන් පාඨමාලා මෙහෙයවීමට කටයුතු නොකිරීම නිසා යම් අඩුපාඩු සිදුවී තිබේ. | මෙලෙස විශාල ලෙස සිසුන් විභාග අසමත් වීමට හේතුන් සොයා බලා එම ගැටළු විසදීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉංජිනේරු පීඨයේ E 2018 Batch (C - 18 ) කණ්ඩායමේ 2019 වර්ෂයේ පළමු සමාසිකයේ ME 1201 විෂයය සඳහා විභාගයට පෙනී සිටි සිසුන් 250 න් 153 ක් හෙවත් සියයට 61 ක් විභාගය අසමත් වී තිබුණි. එම විෂය සඳහා කිසිදු A සාමාර්ථයක් ලබා නොතිබූ අතර, C හා C+සාමාර්ථ ලැබූ සිසුන් ගණන 65 ක් විය. | චිත්‍ර යාන්ත්‍රික ඇඳීම දේශන සඳහා වැඩිපුර උපදේශකවරුන් අනුයුක්ත කිරීම, සිසුන්ගේ යාන්ත්‍රික ඇඳීම පරික්ෂා කර බලා ඒවායේ අඩුපාඩු සාකච්ඡා කිරීම හා පුහුණු වීමට අවස්ථාව ලබාදෙමින් යාන්ත්‍රික ඇඳීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. | මෙලෙස විභාග අසමත් වීමට හේතුන් සොයා බලා සිසුන්ට අසාධාරණයක් නොවන වැඩපිළිවෙලක් සකස් කිරීමට කළමනාකරණය ක්‍රියා කල යුතුය. |
| (ඉ) | සාමය හා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා ලියාපදිංචි වූ සිසුන් 26 දෙනෙකු සඳහා වර්ෂ 5 ක් අවසන්වී ඇතත් සිසුන් 14 ක් හෙවත් සියයට 54 ක් පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි. | එම සිසුන් සඳහා වරින්වර ලිපි හා විද්‍යුත් තැපැල මඟින් දැනුම් දීම සිදු කළද සිසුන් කිහිප දෙනෙකු පමණක් එකී මට්ටම සම්පූර්ණ කිරීමට ඉල්ලුම් කර ඇත. | ශිෂ්‍යත්ව වැඩසටහන මත ක්‍රියාත්මක වන පාඨමාලාවන් වන බැවින් එම ශිෂත්වයේ උපරිම වාසි ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඊ) | යම් උපාධි පාඨමාලාවක් ශිෂ්‍යත්ව වැඩ සටහනක් මත ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ ඉටුකර ගත යුතු වුවද සාමය හා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ අපේක්ෂකයින් සමඟ ඒ සඳහා ගිවිසුම් ගත බැඳීමක් ඇති කර ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව දැනට අධ්‍යයන කටයුතු හදාරන ශිෂ්‍යත්වලාභීන් ලවා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු යොදා ඇත. | විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති හරහා ලැබෙන ශිෂ්‍යත්ව රජයට ලැබෙන ප්‍රදානයන් වන බැවින් ඒව සඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැනට විශ්වවිද්‍යාලය තුළ සේවය නොකරන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 04 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.858,745ක පර්යේෂණ දීමනා වලට අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මෙම නිලධාරීන් රුහුණ විශ්විද්‍යාලයේ සේවයේ යෙදී සිටියදී පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කර පර්යේෂණ දීමනා ලබාගත් අතර ඔවුන් ස්ථාන මාරු වී ගිය අවස්ථාවේ සිට ගෙවීම් නතර කරන ලදී. | පර්යේෂණ දීමනා ලබා ගන්නා සියලුම නිලධාරීන්ගෙන් පර්යේෂණ වාර්තා ලබා ගැනීමට ක්‍රියා කල යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 පෙබරවාරි 23 දින වන විට කළමනාකරණ හා මූල්‍ය පීඨ ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරුට මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20ක් වූ රු.45,423,367 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණද වසර 02ක් වූ ගිවිසුම් කාලය ඉක්මවන තුරු ලබාදුන් අත්තිකාරම් මුදලට සරිලන වැඩ කොටසක් ඉටු කර නොගැනීම කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතාවයක් විය. | මෙම අත්තිකාරම් මුදල ගෙවීමේදී ඊට සුරක්ෂණ ඇපකරයක් විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන ඇත. එම නිසා අත්තිකාරම් මුදලට අදාළ කිසිඳු වැඩ කොටසක් ඉටු නොකෙරුවද එම අත්තිකාරම් මුදල අයකර ගැනීමේ ආවරණ හැකියාවක් විශ්වවිද්‍යාලය සතුවේ. | කොන්ත්‍රාත් පරිපාලනය විධිමත්ව සිදුකර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමටත් ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014-2018 කාල පරිච්ඡේදයට අදාළ සංයුක්ත සැලැස්ම අනුව 2018 වර්ෂය වන විට නව දුරස්ථ පාඨමාලා 22ක් හා මාර්ගගත පාඨමාලාවක් ආරම්භ කිරීමටත් සියලු දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන උපාධි පාඨමාලාවන් වලින් සියයට 60ක් රැකියා අරමුණු කරමින් විෂයමාලා සංවර්ධනය කිරීමටත් සැලසුම් කර තිබුණද කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුනි. | 2015 වර්ෂයේ ගාල්ල හා හම්බන්තොට ප්‍රාදේශීය මධ්‍යස්ථාන 02 ක් ආරම්භ කරන ලද අතර මේ මගින් රැකියා අරමුණු කර ගත් විවිධ පාඨමාලා ආරම්භ කිරීම සඳහා අයදුම්පත් කැඳවුවත් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම හා මෘදුකාංග පද්ධතියක් නොලැබීම හේතුවෙන් ආරම්භකර නොතිබුණි. | තාර්කිකව සැලසුම් සකස් කර ඒ අනුව ඉලක්ක පිහිටුවා ඒවා සාධනය කර ගැනීමට ආයතනයේ සම්පත් මෙහෙයවීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |